## කොළඹ විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව

## ශාස්ත්‍ර පීඨය

## ශාස්ත්‍රවේදි තෙවන වසර පරීක්ෂණය - 2018

## (බැංකු සහ මූල්‍ය / ව්‍යාපාර සහ කළමනාකරණ ආර්ථික විද්‍යාව - Study Stream)

## පළමු සෙමෙස්තර වාර අවසාන පරීක්ෂණය

# ECN 3171: ව්‍යාපාර සහ වෘත්තීය ආචාර ධර්ම

**කාලය - පැ දෙකක් (02) පමණයි**

**ඕනෑම ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න. පිළිතුරු ප්‍රශ්නවලට අදාළව කෙටියෙන් ලියන්න.**

**සියලුම ප්‍රශ්නවලට සමාන ලකුණු ලැබේ.**

---

1.

i. සාමාන්‍යයෙන් ආචාර ධර්ම සකස් වනුයේ විසංයුක්ත අදහස් (Abstract Ideas), උපකාරි වටිනාකම් (Instrumental Values) සහ ආන්තික වටිනාකම් (Terminal Values) වලිනි. අවශ්‍ය අවස්ථාවන්හී උදාහරණ දෙමින්, විසංයුක්ත අදහස්, උපකාරි සහ ආන්තික වටිනාකම්හි ස්වභාවයන් විස්තර කරන්න. (ලකුණු 10)

ii. ඔබ ආයතනික ආචාර ධර්ම පිලිබඳව ප්‍රවීණෝපදේශකයෙකු (Consultant) යැයි සිතන්න. ඔබට පහතින් දක්වා ඇති තත්වයන් දී ඇත. එම තත්වයන් සමනයට සුදුසු විසඳුම් ඔබෙන් බලාපොරොත්තු වේ.

(a) මගේ ආයතනික ප්‍රධානියා දරදඬු පුද්ගලයෙකු වන අතර ඔහු සේවයට බඳවා ගනු ලබනුයේද සමාන අදහස් දරන පුද්ගලයින්ය. මගේ ආයතනයේ ආචාර ධර්ම පිළිබඳව ගැටලු ඇති වෙමින් පවතී. මා කුමක් කරමද?

(b) මගේ ආයතනයේ සේවකයන් කිහිපදෙනෙකු පාරිභෝගික රහස්‍ය තොරතුරු අප ආයතනයේ තරගකාරී ආයතන වෙත ලබා දෙන බව මම දැන ගතිමි.

(c) ආයතනයේ කාර්යසාධන ප්‍රතිචාරය (Performance Feedback) වැඩසටහන් වරද නැති කරන (Corrective) හෝ දඬුවම් පමුණුවන (Penalizing) ප්‍රවේශයන් පිළිපැදිය යුතුද? (ලකුණු 5 බැගින්)

2.

i. ඔබ අධ්‍යනය කර ඇති ව්‍යාපාර ආචාර ධර්ම පිලිබඳ ප්‍රධාන අවකාශයන් (Important Areas) විස්තර කරන්න. (ලකුණු 7)

ii. ව්‍යාපාරික ආයතන තුළ දක්නට ලැබෙන පොදු විෂමාචාරයන් (Common misconducts) කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 8)

iii. ව්‍යාපාර ආයතන තුළ දක්නට ලැබෙන ආචාර සම්පන්න නොවන හැසිරීම්වලට පොදුවේ බලපානු ලබන හේතු මොනවාදැයි විස්තර කරන්න. (ලකුණු 10)

3.

i. ආචාර ධර්ම උභතෝකෝටිකය (Ethical Dillema) යන්නෙන් ඔබට තේරුම් යන්නේ කුමක්ද? ව්‍යාපාර ආයතන තුළ ආචාර ධර්මානුකූල හැසිරීම නිසා ඇතිවන ප්‍රතිලාභ මොනවාද? (ලකුණු 12)

ii. "ව්‍යාපාරික ආයතනවලට අදාළ ආචාර ධර්ම වෙනමම ආචාර ධර්ම න්‍යායක් නොවන අතර ඒවා හුදෙක් ව්‍යාපාරික සංසිද්ධීන් සඳහා ආචාර ධර්ම අදාළ කර ගැනීමකි". ඔබ මෙම ප්‍රකාශය සමග එකඟ වෙනවාද? උදාහරණ දෙමින් ඔබගේ පිළිතුර විස්තර කරන්න. (ලකුණු 13)

4.

"ආරක්ෂාකාරී නිෂ්පාදන නිර්මාණය (Creating safe products), රැකියා ජනනය (Creating jobs), අපක්ෂපාතී සේවක සංග්‍රහය (Fair treatment of employees), පරිසර ආරක්ෂණය (Environmental protection) සහ සත්‍යවාදී මූල්‍ය ප්‍රකාශන (Truthful about financial status) ආචාර ධර්මවල කොටසක් ලෙස සැලකේ. ඔබ මෙම ප්‍රකාශය සමග එකඟද?ඔබගේ පිළිතුර විස්තර කරන්න. (ලකුණු 25)

5.

i. නීතිය, ආචාර ධර්ම සහ සදාචාරය (Law, ethics and morality) යනාදිය ඔබ නිර්වචනය කරනුයේ කෙසේද? (ලකුණු 8)

ii. නීතිය සහ ආචාර ධර්ම (Law and Ethics) අතර සමාන අසමානතා කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 8)

iii. බැඳියා පිළිගැටුම (Conflict of interest) ප්‍රධාන ආචාර ධාර්මික ගැටළුවක් වුවත් එය නීති විරෝධී නොවේ. එය නීති විරෝධී නොවුනත් බැඳියා පිළිගැටුමෙන් ව්‍යාපාරික හෝ වෘත්තිමය ප්‍රතිපත්ති උල්ලංඝනයන් සිදු වනවාද? ඔබගේ පිළිතුර විස්තර කරන්න. (ලකුණු 9)

6.

i. සංස්ථානික පාලනය (Corporate Governance) යන සංකල්පය සහ සංස්ථානික පාලනය වර්තමාන තත්වයට විකාශනය වූ ආකාරය විස්තර කරන්න. (ලකුණු 10)

ii. තත්කාලීන ව්‍යාපාරික ආයතනයක අදාළ සංස්ථානික පාලන ව්‍යුහය කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 7)

iii. ව්‍යාපාරික ආයතනයක අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්ය භාරය සහ අධ්‍යක්ෂ මණ්ඩලයත් ව්‍යාපාර ආචාර ධර්මත් අතර සම්බන්ධතාවයන් විස්තර කරන්න. (ලකුණු 8)

7.

i. පාරිභෝගික තොරතුරු ප්‍රවේශය (Ease of access) සහ පරිහරණය පහසුව (Ease of **use**) යනාදී සංකල්පයන්ට අනුව තාක්ෂණික ප්‍රගතිය තත්කාලීන ව්‍යාපාරික ආයතනවල අනිවාර්ය අංගයකි. තාක්ෂණික ප්‍රගතිය හේතුවෙන් ව්‍යාපාරික ආයතන තුළ පැන නගින ආචාර ධර්ම ගැටලු මොනවාද යන්න කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 12)

ii. තාක්ෂණික ප්‍රගතිය ශ්‍රමික ඵලදායිත්වය ඉහළ දැමීමට උපකාරී වේ.මේ නිසා ඔබ රැකියාවේ නිරත විට ඔබගේ කටයුතු තාක්ෂණය උපකාරයෙන් නිරීක්ෂණය කෙරෙනු ඇත. මෙම තත්වය සමග මතුවන ආචාර ධර්ම ගැටලු කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 13)

8.

i. ශක්තිමත් ආචාර ධර්ම සංස්කෘතියක් පවත්වා ගැනීමට ව්‍යාපාරික ආයතන අසමත්වන විටකදී ආරක්ෂාව තහවුරු කර ගැනීමේ අවසාන අවස්ථාව නීතිය සහ නියාමන රාමුවයි (Law and regulatory framework). නීතිය සහ නියාමන රාමුව සපයන්නකු ලෙස රජයේ කාර්යභාරය විස්තර කරන්න. (ලකුණු 12)

iii. සේවකයෙකු විසින් ව්‍යාපාරික ආයතනයක දූරාචාරයක් (Malpractice) හෝ විෂමාචාරයක් (Misconduct) පිළිබඳ තොරතුරු අනාවරණය කර ගත් විට එම දූරාචාරය හෝ විෂමාචාරය නීතිය ක්‍රියාත්මක කරන නිලධාරීන්ගේ අවධානයට ලක් කිරීම හෝ මාධ්‍යට ඉදිරිපත් කිරීම එම සේවකයාට ඇති එක් විකල්පයකි. එසේ කිරීමට ප්‍රථම එම සේවකයා සලකා බැලිය යුතු කොන්දේසි මොනවාදැයි විස්තර කරන්න. (ලකුණු 13)

9.

i. ලාභය උපරිම කර ගැනීම සඳහා නූතන ව්‍යාපාරික ආයතන අක්වෙරළ (Off-Shore) වෙළඳපළට යොමු වේ. මෙම ආයතන තාක්ෂණික දැනුම සහ ප්‍රාග්ධනයද රැගෙන එන නිසා දියුණු වෙමින් පවතින රටවල් මෙම විදේශීය කර්මාන්ත පිළිගනු ලබයි. මෙම ගෝලීයකරණය නිසා මතු වෙමින් පවතින ආචාර ධර්ම ගැටලු විස්තර කරන්න. (ලකුණු 13)

ii. ගෝලීයකරණය තුළින් ඇතිවන ආචාර ධර්ම ගැටලු පාලනය කර ගැනීම සඳහා යෝජිත භාවිත චර්යාව (Code of conduct) කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 12)

---0---

/

University of Colombo-Sri Lanka

Faculty of Arts

Third Year Examination in Arts (Banking and Finance/Business and Managerial Economics – Study Stream)-2018

(First Semester Final)

ECN 3171 – Business and Professional Ethics

Time Allowed: Two (02) hours only

Answer only four (04) questions.
Answers should be written legibly and wherever possible in point form.
Equal marks for each question.

---

(1) (a) Generally, ethics are formed from abstract ideas, instrumental values and terminal values. Explain the nature of abstract ideas, instrumental and terminal values providing examples wherever necessary. (10 marks)

(b) Consider that you are a professional consultant on work place ethics and the following situations were given to you. You are requested to provide the organization with suitable solution(s).

(i) My boss is a tough person and hiring like-minded people. Ethics is becoming a question in my organization. What should I do?

(ii) I find a few employees of my organization revealing confidential information of clients to our competitors. How should it be address?

(iii) "Should the performance feedback sessions be followed by corrective or penalizing approach?" (5 marks each)

(2) (a) Explain the two important areas of business ethics you have studies.

(7 marks)

(b) Briefly explain the common misconducts found in business organisations.

(8 marks)

(c) Explain the common causes of unethical behavior especially in business organisations. Provide useful examples to explain your answer. (10 marks)

(3) (a) What do you understand by ethical dilemmas? What are the benefits of ethical behavior in business organisations? (12 marks)

(b) Ethics that applies to business are not a separate theory of ethics; rather, it is an application of ethics to business situations? Do you agree with the statement? Explain your answer providing examples where ever necessary. (13 marks)

(4) (a) Creating safe products, Creating jobs, Fair treatment of employees, Environmental protection and Truthful about financial status are considered part of business ethics. Do you agree with the statement? Explain your answer. (25 marks)

(5) (a) How would you define law, ethics and morality? (8 marks)

(b) Briefly explain the similarities and differences between law and ethics (8 marks)

(c) Conflict of interest is a major ethical question that is generally not illegal. Since it is not against the law, does it violate company or professional policies? Explain your answer. (9 marks)

(6) (a) Explain the concept of corporate governance and the evolution of corporate governance to the present form. (10 marks)

(b) Explain briefly corporate governance structure of a modern-day business organization. (7 marks)

(c) Explain the role of Board of Directors of a business organization and its relationship with business ethics. (8 marks)

(7) (a) The technological advances are an essential part of modern business to make "ease of access "and "ease of use" of information of the customers. Briefly explain ethical issues emerged in business organization due to technological progress. (12 marks)

(b) The technological advances are to increase worker productivity. Hence, when you are at work, your activities are monitored with the help of technology. Briefly discuss the ethical issues related with this. (13 marks)

(8) (a) "When business organisations fail to maintain a strong ethical culture, the last line of defense is the legal and regulatory framework". Discuss the role of the government as a provider of legal and regulatory framework. (12 marks)

(b) When an employee discovers evidence of malpractice or misconduct in the business organization, one option available is to bring the misconduct to the attention of law enforcement officials or the media. Explain the conditions the employee should consider before doing it. (13 marks)

(9) (a) To maximise profits, modern business organizations penetrate off-shore markets. Countries in the developing world welcome foreign business because they bring in technological know-how and capital. Discuss the possible ethical issues emerged due to globalization. (13 marks)

(b) Briefly explain code of conducts proposed to control ethical problems due to globalization. (12 marks)

------------------------End of Examination------------------------